# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1714/18 - 2011 ජූලි 13 වැනි බදාදා - 2011.07.13

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලැබූ ඉඩම පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත් එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය ජනක බණ්ඩාර තෙන්නකෝන් වන මම මෙයින් ප්‍රකාශ කරමි.

බස්නාහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයේ, බණ්ඩාරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අධිකාරීපත්තුව සුළු කොට්ඨාශයේ, කොළමැදිරිය ගමේ පිහිටි, සර්වේයර් ජනරාල්ගේ අංක කේජ්/බීඑන්ඩී / 10 / 40 හා 2010.07.20 දිනැති ප්‍රගමණ අනුරේඛණයේ කැබලි අක්ෂර ''ඒ'' වශයෙන් සඳහන් තල්ගහහේන නැමැති ප්‍රමාණයෙන් හෙක් 0.0108 ක් පමණ වූ පහත සඳහන් ඉඩම් කැබැල්ලට මායිම්:

1. කැබලි අක්ෂර ''ඒ'' - තල්ගහහේන - ප්‍රමාණය :හෙක් 0.0108
උතුරට: පැරණි මාර්ගය සහ මු.පි.ක. 3601 හි කැබලි අංක 53; නැගෙනහිරට: හෙට්ටි අප්පුහාමිලාගේ දොන් චන්ද්‍රසේන විසින් හිමිකම් කියන තල්ගහහේන; දකුණට: හෙට්ටි අප්පුහාමිලාගේ දොන් චන්ද්‍රසේන විසින් හිමිකම් කියන තල්ගහහේන, මු.පි.ක. 3601 හි කැබලි අංක 66 හා 67; බටහිරට: මු.පි.ක. 3601 හි කැබලි අංක 66,67 පැරණි මාර්ගය සහ මු.පි.ක. 3601 හි කැබලි අංක 53.

ජනක බණ්ඩාර තෙන්නකෝන්,
ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍ය.

යොමු අංකය: එල්ඩී/05 /2009 /එච්ඩබ්/ එස්ටීඩීපී/ ජේබීඅයිසී/ 204.
ප්‍රාලේ අංකය: බ/ඉ/3/2/49.
2011 ජුනි මස 24 වැනි දින,
''ගොවිජන මන්දිරය'', රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07-697

1A – G014791 – 465 (2011/07) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.